# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

India's National Spiritual Newspaper

₹ 10/-

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE (ECHO GROUP)

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XVI | YEAR OF OUR LORD JESUS CHRIST, JUNE 2022 | Issue No. 7


## ශුද්ධවූ බයිබලය

### (හිතෝපදේශ 4:1-10)

1. මාගේ පුත්‍රයෙනි, පියෙකුගේ ගුරුකම් අසා, නුවණ දැනගැනීමට කන් යොමු කරන්න.

2. මක්නිසාද මම යහපත් ඉගැන්වීම නුඹලාට දෙමි, මාගේ උපදෙස් අත් නොහරින්න.

3. මක්නිසාද මම මාගේ පියාට ප්‍රිය පුත්‍රයෙක්ව, මාගේ මවු ඉදිරියෙහි මෘදුවූ එකම පුත්‍රයෙක්ව සිටියෙමි.

4. ඔහු මට උගන්වමින් මෙසේ කියේය, ඒ මාගේ වචන නුඹේ සිතේ තබාගන්න. මාගේ ආඥා රක්ෂාකොට ජීවත්වන්න.

5. ප්‍රඥාව ලබාගන්න, නුවණ ලබා ගන්න, එය සිහිනැති නොකරන්න, මාගේ මුඛයේ කීම්වලින් අහක්ව නොයන්න.

6. ප්‍රඥාව අත් නොහරින්න, එවිට ඈ නුඹ ප්‍රවේශම්කරනවා ඇත. ඈට ප්‍රේමකරන්න. ඈද නුඹ ආරක්ෂා කරනවා ඇත.

7. ප්‍රඥාව ප්‍රධාන දෙයය, එබැවින් ප්‍රඥාව ලබාගන්න. එසේය, නුඹ ලබාගන්න සියල්ල ඇතුළුව, නුවණ ලබාගන්න.

8. ඇය ශ්‍රේෂ්ඨකරන්න, ඈද නුඹ උසස්කරන්නීය, නුඹ ඇය වැළඳගත්තාම. ඈ නුඹ ගෞරවයට පමුණුවන්නීය.

9. ඈ නුඹේ හිසට ශෝභන මාලාවක් දෙන්නීය. අලංකාර ඔටුන්නක්ද ඈ නුඹට පළඳවන්නීය.

10. මාගේ පුත්‍රය, කන්දී මාගේ කීම පිළිගන්න, එවිට නුඹේ ජීවිතයේ අවුරුදු බොහෝ වන්නේය.

## ඔබගේ වැලපීම ප්‍රීතියට හරවන සේක.

### YOUR MOURNING WILL TURN INTO JOY! (Psalm 30:11)

(ගීතාවලිය 30:11)

(පාස්ටර් සෑම් සෙල්ව රාජ් ප්‍රධාන සභාවේ බෙදාගත් පණිවිඩයකි.)

අප ඉතා පීඩාවෙන් හා වේදනාවෙන් ගමන්කරන විට දී අප මිත්‍රයින් හා වෛද්‍යවරුන් වෙත ගිය විටදී ඔවුන් දෙන්නාවූ උපදෙස නම්, ''දුක්වෙන්න එපා , හැමදේම හරියයි, ඔබගේ සියලු ප්‍රශ්න ටික කාලයක් යද්දි විසදෙයි.'' කියා අපට සනසනු ලබයි. බොහෝ දෙවියන්වහන්සේගේ දරුවන් ඔවුන්ගේ ජීවිතයේ දුකින් වේදනාවෙන් හා දිනපතා ප්‍රශ්ණකාරී අවස්ථාවන් වැඩිවීම නිසා ඔවුන් ඔවුන්ගේ බලාපොරොත්තු නැතිකරගෙන තිබේ. අපගේ ජීවිතයට දෙවියන්වහන්සේගේ මඟපෙන්වීම පැහැදිලිව නොමැති විටදී අප බොහෝ දුක් විදිමු. උදාහරණයක් දෙස අප බැලුවහොත් පසුගිය කාලයේදී කොවිඩ් 19 කරණකොටගන මුළු ලෝකයම දුක්වින්දේය. අපගේ ජීවිතයට දුකක්, කරදරයක්, වේදනාවක් හෝ ලෙඩ රෝගයන් සෑදී ඉතා වේදනාකාරී තත්ත්වයකට පත්වූ විටදී මේ සෑම දුක් පීඩා මැදදී, මේ සියල්ල සිදුවෙන්නේ දෙවියන්වහන්සේ නොදැනද ''මගේ මේ ප්‍රශ්නය දෙස දෙවියන්වහන්සේ බලන්නේ නැද්ද?'' කියා අප සිතනු ඇත. නමුත් අප එක් දෙයක් කිසි දෙයක් දෙවියන්වහන්සේ ගේ කැමැත්තෙන් තොරව සිදුවන්නේ නැත කියාය. අප මෙවැනි දුක් පීඩා අත්දැකීම් තුලින් ගමන් කරන විටදී ස්වාමීන්වහන්සේ අපගේ පීඩා සියල්ල ප්‍රීතියට හරවයි.

වර්තමානයේදී ඔබ විදින්නාවූ පීඩා දෙවියන්වහන්සේ ප්‍රීතියට හරවන සේක. භිය නොවන්න. ***''...නුමුත් නුඹලාගේ ශෝකය ප්‍රීතියට හැරෙන්නේය.'' (යොහාන් 16:20)***


මතෙව් 5:4 හි අපි මෙසේ කියවමු. ***''ශෝකවන්නෝ ආශීර්වාද ලද්දෝය. මක්නිසාද ඔව්හු සනසනු ලබන්නෝය.''*** යනුවෙනි. සමහර විට අප සිතනවා තමාගේ ජීවිතයට මේ ලෝකයේ ඇති හැම සැප සම්පතක්ම තිබෙන්නාවූ අය ආශිර්වාද ලත් අය කියා නමුත් දෙවියන්වහන්සේ පවසනු ලබන්නේය. වැලපෙන්නාවූ අය ආශිර්වාද ලද්දෝය. කියාය. මෙය පුදුමයක් නොවේද? මන්ද වැලපෙන්නෝ ආශිර්වාද ලද්දෝය කියා දෙවියන්වහන්සේ දනී. එසේම වැලපෙන්නන්ගේ දුක ප්‍රීතියට හරවන බව උන්වහන්සේ මුළුමනින්ම දනී. මෙයට එකඟ වීමට මනුෂ්‍යයන්ට අමාරුය.

යම් පුද්ගලයෙකුගේ හදවත තුළ කිසියම් දුකක් හා වේදනාවක් ඇති වෙනුයේ රැකියාවක් නොමැති නිසා නොයෙකුත් රෝග නිසා, මුදල් අවශ්‍යතා නිසා පවුලේ හා රැකියා කරන ස්ථානයෙහි පවතින නොයෙකුත් ප්‍රශ්න නිසා හා අනාගතය ගැන ඇති දුක නිසාය. මෙවැනි කුමන දුකක් අපිට පැමිණුනත් දෙවියන්වහන්සේ අපට පවසනුයේ, අප මෙවැනි අමාරුකම් තුලින් ගමන් කරනු ලැබුවත් ස්වාමින්වහන්සේ අපව සනසන බවත් අපගේ අමාරුකාලය ප්‍රීතියට හරවන බවත්ය. යේසුස්වහන්සේ මේ ගැන අපට පෙර කාලයකදි පොරොන්දු වූවත් එය අදටත් සිදුවෙනු ඇත. ඒ නිසා ඔබ නිතරම ප්‍රීති වෙන්න. ***''එබැවින් දෙවියන්වහන්සේ සුදුසු කාලයේදී නුඹලා උසස් කරන පිණිස උන්වහන්සේගේ බලවත් හස්තයට යටත් වෙයල්ලා.'' (1 පේතෘස් 5:6)*** අපගේ දුර්වලකමේදීත්, දිළිඳුකමේදී අප ස්වාමින්වහන්සේ කථාකරන්නාවූ හඬ ඇසෙනු ඇත. කිසිම දුක් වේදනා අත්දැකීම් තුලින් නොයන කෙනාට දෙවියන්වහන්සේගේ හඬට ඇහුම්කන් දීමට අමාරුය. අප අධෛර්‍යයට පත් වී වේදනාවන් තුළින් ගමන් කරන විටදී

3 වෙනි පිටුවට ...

ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)

## from your dearly beloved brother...



# කැඳවීමේ ප්‍රතිරාවය

"නුඹේ සීමා තුළ සමාදානය සිදුකරනසේක. ඉතා උතුම් ගෝධුමයෙන් නුඹ පුරවන සේක." (ගීතාවලිය 147:14)



### OUR MISSION POLICY

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.

CHIEF EDITOR
Angeline Selvakumari Henry, M.A., M.Ed.
MANAGING EDITOR
Pastor Alex Samson Sam, B.Th., M.Div.
ADMINISTRATION
Bro. N. Prakasam, M.A., General Manager
EDITORIAL BOARD
Sis. Jesy Veena Sam
Bro. M. Paulraj, M.A., B.Ed.
Sis. Serena Bevin, M.A., M.Phil., B.Ed.
EDITOR, PUBLISHER & PRINTER
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 95561 31858
E.mail ID
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in
WEBSITES
www.echoofhiscall.org
www.stpaulsmatriculation.com
YOUTUBE CHANNEL
Echo of His Call

**ස්වාමින්වහන්සේ තුළ ප්‍රිය මිත්‍රවරුනි,**
**අපගේ ස්වාමිවූ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ බලවත්වූ නාමය ඔබට සුභ පැතුම් ගෙනෙමි.**

### කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව

අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උතුම් වූ කරුණාව නිසා කැඳවීමේ ප්‍රතිරාවය මේ වන විට භාෂාවන් 16 කින් අද දක්වා මුද්‍රණය කරගෙන ඒමට කරුණාව දී තිබේ. මෙය මුද්‍රණය කිරීමට උපකාර කරන්නාවූ ඒ උදෙසා යාච්ඤා කරන්නාවූ සැම දෙනාටම දෙවියන්වහන්සේ ආශිර්වාද කරනු ඇත. විවිධ භාෂාවන් කථාකරන්නාවූ අය මෙම සඟරාව කියවා ඒ තුළින් ඉතා බලවත් ලෙස ආශිර්වාදය ලබයි.

### නෙහෙමියා බයිබල් විදුහල (හින්දි)

අපට මෙම විදුහලට හින්දි භාෂාවෙන් ඉගෙන ගැනීමට ශිෂ්‍යයෝ අවශ්‍ය වී ඇත. 2022 ජූනි 6 වන දින මෙම විදුහලෙහි පංති ආරම්භ වෙනු ඇත. අපගේ මෙම බයිබල් විදුහල තුළ අධ්‍යාපනය, කෑම බීම, නවාතැන් පහසුකම් ආදී සියල්ලම නොමිලයේ ලබාදෙනු ඇත. කරුණාකර මෙම පණිවිඩය ඔබගේ මිතුරු මිතුරියන්ට දැනුම් දෙන්න. මෙම විද්‍යාලයේ වසරක අධ්‍යාපනයෙන් පසු සහතිකයක්ද දෙනු ලබයි. අපගේ විදුහල ATA ආයතනය හා සමඟ ලියාපදිංචි කර තිබේ. ATA ආයතනය මුළු ලෝකයෙහිම තිබෙන බයිබල් විදුහල් හා සමඟ වැඩ කරනු ලබයි.

### සවස්කාලීන නෙහෙමියා බයිබල් විදුහල (දෙමළ)

සවස් කාලය බයිබල් විදුහල ද්‍රවිඩ භාෂාවෙන් ඉතා හොඳින් ක්‍රියාත්මක වෙනු ඇත. මෙම විදුහල 2022 ජූනි මස 06 වන දින ආරම්භ විය. මෙම පංති සඳහාද තවත් ශිෂ්‍යයින්ට පැමිණීම සඳහා ඉඩකඩ තිබේ. මේ සඳහා අප එක වසරක් සඳහා සහතිකයක්ද වසර දෙකක් සඳහා ඩිප්ලෝමාවක්ද පිරිනමමු.

### නෙහෙමියා බයිබල් විදුහල් පුස්තකාලය

දෙවියන්වහන්සේගේ කරුණාවෙන් අපගේ බයිබල් විදුහලේ ඇති සියලු පොත් ටිකෙන් ටික පරිගණකයකට ඇතුළත් කරමින් පවතිමු. අපගේ මෙම පුස්තකාල සතුව පොත්පත් 7000ක් පමණ ඇති අතර මෙම සියලුම පොත් කිසියම් පිළිවෙළක් ඇතිව සකසා ගැනීම සඳහා අපට බොහෝ වැඩකටයුතු ප්‍රමාණයක් කිරීමට ඇත. අප සිතනවාට වඩා වැඩ කටයුතු අධිකව පවතී. මේ කටයුතු සඳහා දෙවියන්වහන්සේ අපට බොහෝ මුදල් සපයයි කියා විශ්වාස කරමු. ***"මාගේ දෙවියන්වහන්සේ ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ තමන්ගේ තේජසේ සම්පතේ ප්‍රකාරයට නුඹලාගේ සියලු හිඟකම් සම්පූර්ණ කරන සේක" (පිලිප්පි 4:19)***

### 2021 - 2022 දක්වා වසරක් සඳහා නෙහෙමියා බයිබල් විදුහලෙහි ශිෂ්‍යයින් හට උපාධි පිරිනැමීමේ දේව මෙහෙය

දෙවියන්වහන්සේගේ කරුණාවෙන් 2021-2022 දක්වා කාලය තුළ අපගේ බයිබල් විදුහලේ අධ්‍යාපනය සමත් වූ සියලු දෙනාටම උපාධි පිරිනැමීමේ උත්සවය වේපරි,

Our Ministries: ECHO OF HIS CALL Monthly Magazines (16 languages) BIBLECOR - Postal Courses (3 languages) Online Courses Theological Correspondence Courses (2 languages) Church Planting Nehemiah Bible Colleges Gospel Printing Press Great Commission Partners St. Paul's Matriculation School Crusades Community Development

ප්‍රශවාකම්, චෙන්නෙයි 7 හි 2022 ජුනි මස 03 වන දින සවස 5.00ට පවත්වනු ලබයි. මේ සඳහා ඔබගේ යාච්ඤාව අප බලාපොරොත්තු වෙමු. ඔබ එම දිනදී චෙන්නෙයි නුවර සිටීනම් එයට සහභාගීවෙන්නය කියා ආරාධනා කරමු.

## ශුභාරංචිය උතුරු ඉන්දියාවට ගෙන යාම

උතුරු ඉන්දියාවට ශුභාරංචිය ගෙන යාමට බොහෝ කලක සිට අප හදවත්වල තිබූ ආශාවකි. තවද එම පළාතෙහි ජීවත් වූ අයට උපකාර කිරීමද අපට ඇති තවත් ආශාවකි. විවිධ භාෂාවන් කථා කරන්නාවූ අයට ශුභාරංචි පත්‍රිකා බෙදා දීමටද අප බලාපොරොත්තු වෙමු. මෙහි ඔරිසා යන පළාතට නෙහෙමියා බයිබල් විද්‍යාලයේ සිටින්නාවූ සියලුම ශිෂ්‍යයින් රැගෙන ගොස් මේ සේවය කිරීමට බලාපොරොත්තු වෙමු. අපට තිබෙන්නේ එක් ජීවිතයකි. එය ස්වාමීන්වහන්සේගේ සේවය කිරීමට කැප කරමු.

## ශාන්ත පාවුල් මෙට්‍රිකියුලේෂන් පාසල

මෙම පාසලේ වැඩකටයුතු ඉතා හොඳින් ඉටුකරගෙන යමු. මෙම පාසලට එන ළමුන්ව ඔවුන්ගේ නිවසේ සිට පාසලටත් නැවත පාසලේ සිට නිවසටත් රැගෙන යන්නාවූ මිනි බස් රථය අලුත්වැඩියා කිරීමට අවශ්‍යව ඇත. එම වාහනයේ තත්ත්වය හොඳ නොමැති බැවින් අපට අලුත් වාහනයක් ගැනීම උදෙසා යාච්ඤා කරන්න. දෙවියන්වහන්සේගේ කරුණාවෙන් මෙම පාසල ජුනි මස 13 වන දින ආරම්භ කරමු. මෙම පාසල උසස් පාසලක් ලෙස ඉදිරියේදී පවත්වාගෙන යන පිණිස රජය විසින් අපට අවසරය ලබා දී තිබේ. එසේම මෙම පාසල කිතුණු පාසලක් ලෙසද පිළිගෙන තිබේ.

කරුණාකර ඔබගේ යාච්ඤාවේදී අපගේ තැපැල් මාර්ගික බයිබල් පාඩම්මාලාව ගැනත් ශුභාරංචි පත්‍රිකා මුද්‍රණාලය හා සභාව ගැනත් සමාජ සේවය ගැනත් යාච්ඤා කරන්න.

මගේ පවුලේ සාමාජිකයින් හා මා ඉතා හොඳ නීරෝගීව සිටින පිණිස යාච්ඤා කරන්න. අපගේ සහකාර සේවක සහෝදර මෙනුවෙල්, එම්. පෝල් රාජ්, පාස්ටර් මුත්තු සහ සහෝදර ඉලංගෝවන් යන අයගේ පූර්ණ සුවය උදෙසා යාච්ඤා කරන්න.

දෙවියන්වහන්සේ ඔබ සැම දෙනාටම වඩ වඩා ආශිර්වාද කරන සේක. ඔබ කැඳවීමේ ප්‍රතිරාවය සේවයට මුදල්මය අතින් උපකාර කිරීම නිසා ඔබට ස්තුති කරමු. ඔබ උදෙසා යාච්ඤා කරමු. මෙම සියලු සේවා සිදුකරනුයේ දෙවියන්වහන්සේගේ රාජ්‍ය ව්‍යාප්ත කිරීම පිණිසය. ඔබ කැමතිනම් ඔබගේ සම්මාදන් හා දීමනාවන් මෙම සේවයට ලබා දෙන්න. දෙවියන්වහන්සේ සැබවින්ම ඔබට ආශිර්වාද කරන සේක.

දෙවියන්වහන්සේ සැම පීඩා හා කරදර තුළින් අපව ගෙන ආ ආකාරය පිළිබඳව අපට බොහෝ සාක්ෂි ඇත. ඒ සියල්ලම අපට ප්‍රසිද්ධියේ පැවසීමට අසීරුය. අප උදෙසා යාච්ඤා කරන්න. දෙවියන්වහන්සේගේ කරුණාව ඔබ සමඟ පවතීවා.

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඔබගේ සේවක**

**පාස්ටර් සැම් සෙල්වරාජ් සහ ඇලෙස්ත් සැම්සන් සැම්**

(+91) 98412 71858 / 98410 71858, E.mail : samselvaraj333@gmail.com

## *1 පිටුවෙන්....*

ස්වාමින්වහන්සේගේ අත ගැසීම හා උන්වහන්සේගේ හඬ ඇසීමට අපට පුළුවනි. අපගේ ජීවිතයේ සැම දේම ඉතා හොඳින් තිබෙන විටදී අපට දෙවියන්වහන්සේගේ හඬ ඇසීමට අමාරුය. එනිසයි උන්වහන්සේ ''වැලපෙන්නාවූ සියලෝ ආශිර්වාද ලද්දෝය'' කියා පවසනු ලබන්නේ, මන්ද වැලපෙන්නාවූ අයව උන්වහන්සේ විසින් සනසන සේක.

ශුද්ධවූ පාවුළුතුමා ඔහුගේ ජීවිතයේ යම්කිසි වේදනාකාරී අත්දැකීම් තුලින් ගමන් කරන විටදී ඔහුගේ ශරීරයෙහි තිබූ යම්කිසි වේදනාවක් ඉවත් කරන්නය කියා පවසනු ලැබීය. නමුත් දෙවියන්වහන්සේ ඔහුට මෙසේ පිළිතුරු දුන්නේය. ***''මාගේ කරුණාව නුඹට සෑහේය, මක්නිසාද දුර්වලකමේදී මාගේ බලය සම්පූර්ණවන්නේය..'' (2 කොරින්ති 12:9)*** පාවුළුතුමා ඉතා හොඳ ප්‍රීතිමත් ජීවිතයක් ගත කිරීමට අවසථාව තිබූ නමුත් දෙවියන්වහන්සේගේ අත ගැසීම නොමැතිව එවැනි ජීවිතයක් ගත කිරීමට ඔහු කැමතිවූයේ නැත. ඔහු වේදනා හා දුක් මාර්ගයෙහි යාමට කැමති වූවේය. මන්ද එම අත්දැකීම තුළින් ඔහුට දෙවියන්වහන්සේගේ හඬට ඇහුම්කන් දීමට පුළුවනි. එම දේව වචනය ඇසීම ඔහුට මහත් වූ ප්‍රීතියක් විය. ඔහු මෙසේ ලියනු ලබයි. ***''උන්වහන්සේ සහ උන්වහන්සේගේ නැවත නැගිටීමේ බලයත් උන්වහන්සේගේ දුක්වල පංගුකාරකමත් දැනගන්නා පිණිසත්ය.'' (පිලිප්පි 3:11)*** මෝසෙස් ගැන දේව වචනයෙහි මෙසේ පවසයි. ***''මෝසෙස් වැඩුනායින් පසු ඔහු ඵාරාවෝගේ දුවගේ පුත්‍රයායයි කියනු ලැබීම ඇදහීමෙන් එපාකර, විපාකය දෙස බැලූ බැවින් මිසරයේ වස්තුවලට වඩා ක්‍රිස්තුස්වහන්සේගේ නින්දාව මහත් සම්පත්කයි සිතා, කලකට පාපයේ සැම භුක්තිවිඳීමට වඩා දෙවියන්වහන්සේගේ සෙනඟ සමඟ දුක්විඳීම තෝරාගත්තේය.'' (හෙබ්‍රෙව් 11:24-26)***

අප විශාල කරදර මැද යන විටදී එයින් එළියට ඒමට අප කැමති නමුත් එවැනි අවස්ථාවන් වලදී අපගේම බලය තුල අප රැදෙන්නේ නොමැතිව ස්වාමීන්වහන්සේ පමණක්ම අපගේ උපකාරය කියා උන්වහන්සේ කෙරෙහි පමණක් අදහන්නේ නම් එවැනි ප්‍රශ්ණකාරී අවස්ථාවන් වලට දෙවියන්වහන්සේගේ අත්ගැසීම ලැබෙන්න ඕනිය කියා අප ඉවසීමෙන් යුතුව ක්‍රියා කරන්නේ නම් සැබවින්ම සතුරා අපට ගෙන දුන් පීඩාව ප්‍රීතියට හරවා ගැනීමට හැකි වන්නේය. දාවිත් රජතුමා වටාද නපුරුදේ වටකර තිබූ අවස්ථාවේදී දේව මාළිගාව වෙතට ගොස් උන්වහන්සේගේ අභිමුඛත්වයේ උන්වහන්සේගේ කරුණාව අයදිමින් සිටියාය. ඔහු වැරදි කල සැම අවස්ථාවකදීම, පීඩාවට පත්වූ සැම අවස්ථාවකදීම දෙවියන්වහන්සේගේ අභිමුඛත්වයට ගොස් උන්වහන්සේ දෙස බලා සිටියාය. ස්වාමීන්වහන්සේ සැම නපුරෙන් ඔහුව මුදවාගත්තේය. ස්වාමීන්වහන්සේ ඔහුට ආශිර්වාද කරමින් සැබවින්ම ඔහුගේ දුක ප්‍රීතියට හැරවූ සේක. ප්‍රිය දේව දරුව ඔබ ප්‍රශ්නකාරී වේදනාකාරී තත්ත්වයෙන් පෙළෙනවාද? දෙවියන්වහන්සේගෙන් තොරව ඔබගේ ප්‍රශ්න වලට විසඳුම නොසොයන්න. ලෝකයේ මාවත් වල නොයන්න. ලෝකයේ මාර්ග ඔබව පීඩාවට, කරදරයට හා පරාජිත තත්ත්වයට ගෙන එන්නේය. දෙවියන්වහන්සේ ඔබට දැන් කථා කරනවාය කියා සිතන්න. ඔබගේ මුළු පවුල ඇදහිල්ලෙන් ස්වාමීන්වහන්සේ තුල බලාපොරොත්තු තබන්න. ස්වාමීන්වහන්සේ ඔබගේ හදවතේ ආශාව ඉෂ්ඨකරනසේක. එනම්, ඔබට තිබෙන්නේ එක දෙයකි. ඔබ යන දේවස්ථානයට ගොස් එම දේවවස්ථානයට ගරු කරමින් එහි පාලකතුමාට ගරු කරමින් දේව අභිමුඛත්වය තුල සිටින්න. ඔබ මේ දේ කරනවා නම්, ඔබ වෙතට ප්‍රීතිය ගලා එනු ඇත. ***''සමහරුන්ගේ පුරුද්ද ලෙස අපේම රැස්වීම් අත්හැර ඒ දවස ළංවන බව නුඹලාට පෙනෙන ප්‍රකාරයට වඩ වඩා එකිනෙකාට අවවාදකරමු.'' (හෙබ්‍රෙව් 10:25)***

## 1. ශෝකය නිසා ආත්මය දියවේ.

***''ශෝකය නිසා මාගේ ආත්මය දියවේ. ඔබගේ වචනය පරිද්දෙන් මහා ශක්තිමත් කළ මැනව.'' (ගීතාවලිය 119:28)***

කිසියම් පුද්ගලයෙකුගේ ජීවිතයෙහි ආතතයකින් පෙළෙන විටදී ඔහුගේ ජීවිතයට ඇතිවන කරදර, පීඩාවන් හා දුක්විඳීම් වැළැක්වීමට නොහැකිය.

දාවිත් රජතුමා බොහෝ ප්‍රශ්නවලින් ගමන්කලේය. පළමුකොට ඔහුගේ මාමණ්ඩිය වූ සාවුල් රජතුමා ඉන්පසුව ඔහුගේ පුත් අබ්සලොම්ය. බොහෝ අවස්ථාවන් වලදී අන් රජවරුන් හා වෙනත් රටවල සෙනඟ, නමුත් මේ සෑම අවස්ථාවේදීම ඔහුව කැඳවූ දෙවියන්වහන්සේ ගැන ඔහු ඉගෙන ගත්තාය. ඔහුගේ සෑම පීඩාවම දෙවියන්වහන්සේ ප්‍රීතියට හැරවුවේය.

අපගේ ජීවිතයේ මෙවැනි පීඩා හා කරදර තුළින් යනවා ඇත. සමහරු හිත කැඩී ජීවිතය එපා වී දිවි නසාගැනීමට පවා වෑයම් කරයි. එවැනි අවස්ථාවන් වලදී අප උපදෙස් ලබා ගැනීමට මිනිසුන් වෙතට ගිය විට ඔවුන් අපව මුලාකරනු ලබති. සමහරු අපිව වැරදි මාවත් වලට යොමු කරති. මේ සෑම දුක්, පීඩා සහ කඳුළු මැද ගමන්කරන විටදී අප මුළුමනින්ම අපේ ඇදහිල්ල ස්වාමීන්වහන්සේ වෙත තබනවා නම්, සැබවින්ම දෙවියන්වහන්සේ කොන්දේසි රහිතව අපගේ පීඩාවේදී අපට මඟපෙන්වමින් අප පුදුමයට පත්වන ආකාරයෙන් අපව සනසන සේක. ***''මක්නිසාද ඔබවහන්සේ භයානකයන්ගේ චණ්ඩ මාරුතව තාප්පයකට ගසන කුණාටුවක් මෙන් තිබියදී දුප්පතාට බලකොටුවක්ව දිළිඳාට ඔහුගේ විපත්තියේදී, බලකොටුවක්ව, කුණාටුවේදී රක්ෂස්ථානයක්ව, ග්‍රීස්මයේදී සෙවණක්ව සිටිනසේක.'' (යෙසායා 25:4)***

අපට කරදර හා පීඩාවෙන් වැඩිවන කල්හි අප බයිබලය වැඩි වැඩියෙන් හා හයියෙන් කියවිය යුතුයි. දෙවියන්වහන්සේ විසින් අපට ලැබෙන්නාවූ එම මිදීම විශ්වාස කල යුතුය. උන්වහන්සේගේ දරුවන්ට උන්වහන්සේ කලාවූ පුදුම ක්‍රියාවන් අපටත් කරන බව අප විශ්වාස කරමින් එය බලාපොරොත්තු විය යුතුය. ඔබ බලාපොරොත්තු වන පුදුම දේ සැබැවින්ම ස්වාමින්වහන්සේ ඔබට ඉටුකරනවා ඇත. මේ පණිවිඩය ඔබට ලියන්නාවූ මම ද නිතරම දෙවියන්වහන්සේගේ අභිමුඛත්වයෙහි සිටිමින් උන්වහ්නසේගේ වචනය විශ්වාස කර ශබ්දනඟා දේව වචනය කියවමින් සම්පූර්ණ ඇදහිල්ලෙන් යුතුව එය මෙනෙහි කරමින් සිටින විට දෙවියන්වහන්සේගේ වචනයෙන් උන්වහන්සේ මට කථා කරනු ඇත. මගේ සියලුම අමාරුකමේදී උන්වහන්සේ මාව ජයග්‍රාහී මාවතකට ගෙන එන්නේය. එවැනි ක්‍රියාවන් ස්වාමින්වහන්සේ ඔබගේ ජීවිතයෙහිද ඉටු කරන සේක.

## 2. ඇස ක්ෂයවෙයි

***''පීඩාව නිසා මාගේ ඇස ක්ෂයවේ. ස්වාමිනි දවස්පතා ඔබට යාච්ඤා කලෙමි. ඔබ දෙසට මාගේ අත් දිගුකළෙමි.'' (ගීතාවලිය 88:9)***

මෙහිදී දාවිත් රජතුමා ඔහුගේ පීඩාව නිසා ඔහුගේ ඇස ක්ෂය වන බව ලියනු ලබයි. කෙනෙක් දුකින් සිටිනවා නම්, ඔහුගේ ඇස් දිහා බැලූ විට එම ඇස්වල වෙනස තේරෙනු ඇත. දුක බැලූ විට ක්ලාන්තභාවය ද ඇති වෙයි. කල්පනා ශක්තිය ද අඩුවෙයි. නිතරම නිදිමත හැදෙයි. අනාගතය ගැන තිබෙන බලාපොරොත්තුව නැතිවෙයි. අන් අයගෙන් අපට ලැබෙන උදවු උපකාරයන් ද අඩුවෙනු ඇත. අපට මෙවැනි අධෛර්‍යකම් වලින් එළියට ඒමට පුළුවන් ද? එසේනම් අපට කරුණු 2ක් කිරීමට පුළුවනි.

1. අප සිටින්නාවූ තත්ත්වය ගැන යාච්ඤාවෙන් ස්වාමින්වහන්සේට පැවසීමට හැකිය. ***''මාගේ මාර්ග කියාදුනිමි. ඔබ මට උත්තර දුන් සේක. ඔබගේ නෙත් මට ඉගැන්නුව මැනව.'' (ගීතාවලිය 119:26)*** ඔබ කිසියම් වේලාවක් ගෙන ස්වාමින්වහන්සේ සමග කථා කිරීමෙන් ඔබට මහත් ජයග්‍රහණයක් ලැබෙනු ඇත. නමුත් මේ කාල වකවානුවේදී මනුෂ්‍යයන් ලෞකික දේට වැඩි කාලයක් යොමු කරනු ඇත. ලෞකික ආශිර්වාද ලබා ගැනීම පිණිස වැඩි කාලයක් යොදවනු ඇත.

තවද විනෝදවීම සඳහා රූපවාහිණිය නැරඹීම සඳහා ද වැඩි කාලයක් යොදවන නිසා අද ඔවුන් යාච්ඤාවෙන් දෙවියන්වහන්සේ සමග කථා කරන්නේ නැත. අද රූපවාහිණී නාලිකාවන් හරහා කිතුණු දේව දාසයින් බොහෝ කිතුණුවන් අලසයින් කර ඇත. යාච්ඤා කරන්නාවූ බොහෝ දේව දරුවන්ට යාච්ඤා නොකරන අතර බයිබලය කියවන අය අද බයිබලය නොකියවන තත්ත්වයකට පත්ව ඇත. අද බොහෝ දෙනා මෙය පුරුද්දක් බවට පත්කරගෙන ඇත. ඔබට නොයෙකුත් කිතුණු වැඩසටහන් නරඹනවා විය හැක. නමුත් ඔබ එය බැලීමට කාලය වැය කලත් ඔබගේ පුද්ගලික යාච්ඤාවට හා බයිබලය කියවා මෙනෙහි කිරීමට වැඩි කාල වේලාවක් යෙදවිය යුතුයි. එවිට ඔබට ජයග්‍රහණය ලබා ගැනීමට හැකි වනු ඇත. උදෑසන පහේ සිට දීර්ඝ කාලයක් ඔබ රූපවාහිණී නාලිකා හරහා කිතුණු වැඩ සටහන් බැලීමෙන් බොහෝ වැරදි ඉගැන්වීම හා වැරදි උපදෙස් ඇහීමෙන් අහංසක කිතුණුවන් බොහෝ සේ මුලාවට පත්ව ඇත. දේශකයන් සියලු දෙනාම විවිධාකාර අදහස් පවසමින් ඔවුන් මනුෂ්‍යයන්ව මුලා කරති. නමුත් මිත්‍රවරුණි ඔබගේ ඇදහිල්ල ස්වාමින්වහන්සේ තුල පමණක් දමන්න.

2. ඔබගේ දෑත් ස්වාමින්වහන්සේ වෙත ඔසවන්න. මෙසේ කිරීමෙන් ඔබ ප්‍රකාශ කිරීමට උත්සහා කරන්නේ ස්වාමිනී, ඔබ කෙරෙහි පමණක් මාගේ විශ්වාසය තබයි කියාය. ඔබ අන් අයට කරදර දෙමින් ඔවුන්ව මුලා කරමින් ක්‍රියාකරනවානම් ඔබ කොතරම් දීර්ඝ යාච්ඤාවන් කරනු ලැබූවත් ඔබ නිරහාරව සිටිනු ලැබූවත් එයින් ප්‍රයෝජනයක් නොමැත. දේව වචනය ඇහුම් කන් නොදී කරන්නවූ යාච්ඤාවට උන්වහන්සේ පිළිතුරු දෙන්නේ නැත. ***''ව්‍යවස්ථාව ඇසීමෙන් තමාගේ කන් ඉවතට හරවා ගන්නාගේ යාච්ඤාව පවා පිළිකුලක්ය.'' (ගීතාවලිය 28:9)*** ''දුෂ්ඨයන්ගේ පූජාව ස්වාමින්වහන්සේට පිළිකුලක්ය. එහෙත් අදහන තැනැත්තාගේ යාච්ඤාවට උන්වහන්සේ ප්‍රසන්නය. දුෂ්ඨයාගේ මාර්ගය ස්වාමින්වහන්සේට පිළිකුලක්ය. එහෙත් ධර්මිෂ්ඨකම අනුව යන්නාට උන්වහන්සේ ප්‍රේම කරන සේක.''

6 වෙනි පිටුවට ...

NEHEMIAH BIBLE
Pray for RESIDENTIAL / EVENING COLLEGE,
Velachery / Chepauk & Santhoshapuram, Chennai.
Medium : Hindi / Tamil
Registered Candidate for Membership
Asia Theological Association (ATA)
Recognised by International Christian Leaders &
Senior Pastors for the past 53 years
Certificate in Theology : One year
Diploma in Theology : Two years
Qualification : 10th Standard & above
Rush for admission!
Contact : The Chairman, Nehemiah Bible College.
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org
✶ ONLINE CLASSES ARE AVAILABLE ✶

GREAT COMMISSION PARTNERS

ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

බෙදා ගැනීම (ගලාති 6:2)
උපකාර කිරීම (රෝම 12:13) සහ
පුබුදු කිරීම (2 තිමෝති 1:6)

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**ජූනි:19-** යේසුස්වහන්සේ තුළ ගැලවීම ලබාගත් නවක කිතුණුවන් ගැන ස්තුති කරන්න.

**ජූනි:20-** දෙවියන්වහන්සේගේ කැඳවීමට කීකරුවී සේවය කරන අය ගැන ස්තුති කරන්න

**ජූනි:21-** යේසුස්වහන්සේ දුන් ගැලවීම කරණ කොටගෙන මත්ද්‍රව්‍යවලින් නිදහස් වූ අය ගැන ස්තුති කරන්න

**ජූනි:22**- ''කැඳවීමේ ප්‍රතිරාවය'' නිර්මාතෘ සැම් සෙල්වරාජ් දේවගැතිතුමා ගැන ස්තුති කරන්න.

**ජූනි:23**- භාෂා 18 කින් මුද්‍රණය වන කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් සේවය ගැන ස්තුති කරන්න.

**ජූනි:24**- දේව සේවය උදෙසා දෙවියන්වහන්සේ සපයන බැවින් ඒ ගැන ස්තුති කරන්න.

**ජූනි:25**- කිතුණු සභාවලට අලුතින් එක්වූණ ඇදහිලිවතුන්ගේ ආත්මික වර්ධනය ගැන ස්තුති කරන්න.

**ජූනි:26**- දේව සේවය තුළ සැම යහපත් බලාපොරොත්තු සඵලකර දුන් දෙවියන්වහන්සේට ස්තුති කරන්න.

**ජූනි:27**- සිය ඇදහිලිවතුන්ට දේවධර්මානුකූල ජීවිතයක් ගතකිරීමට මගපෙන්වන සභා පාලකවරුන් ගැන ස්තුති කරන්න

**ජූනි:28**- වර්තමානයේ සෑම බයිබල් විදුහලකම ඇති ආර්ථික ප්‍රශ්න උදෙසා දෙවිඳුන් යාච්ඤා කරන අය ගැන ස්තුති කරන්න.

**ජූනි:29**- යාච්ඤාවෙන් හා උපකාර කිරීමෙන් දේව සේවයට උදව් කරන අය ගැන ස්තුති කරන්න.

**ජූනි:30**- රජයේ පාසල් පද්ධතියට සම්බන්ධ වී සිටින කිතුණු පාසල් ගැන ස්තුති කරන්න.

**ජූනි:31**- ''කැඳවීමේ ප්‍රතිරාවය'' සේවයේ සෑම සහකාර සේවකයන් ගැන ස්තුති කරන්න.

**2022 ජූලි මාසය**

**ජූලි:01-** ජූලි මාසය පුරාම අප ආරක්ෂා කල දෙවියන්වහන්සේගේ බලවත් හස්තය ගැන ස්තුති කරන්න.

**ජූලි:02-** අධිකරණයෙ සහ පොලීසිය තුළ සේවය කරන සෑම නිළධාරීන් ගැන ස්තුති කරන්න.

**ජූලි:03-** දේශ සීමා පවතින් රටවල දේශ සීමා ආසන්නයේ ජීවත්වන අය ගැන ස්තුති කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**ජූලි:04-** කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් සේවයට මෙම මාසය තුළ මුදල් ප්‍රතිපාදන ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**ජූලි:05-** බොහෝ ආර්ථික ප්‍රශ්න හා දිළිඳුකමින් පෙලෙන අය උදෙසා යාච්ඤා කරන්න.

**ජූලි:06-** කුඩා දරුවන් නොයෙකුත් අපචාර ක්‍රියා තුළින් බේරාගන්නා පිණිස යාච්ඤා කරන්න.

**ජූලි:07-** කිතුණු පවුල් වල ආර්ථික, ආත්මික, ශාරීරික, හා මානසික සුවය පිණිස යාච්ඤා කරන්න.

**ජූලි:08-** ඉශ්‍රායෙලයේ සමාදානය උදෙසා යාච්ඤා කරන්න.

**ජූලි:09-** අල්ලස් ගැනීමට පෙළඹවීමක් ඇති අය ඉන් නිදහස් වන පිණිස යාච්ඤා කරන්න.

**ජූලි:10-** ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීමට යන ධීවරයින් ගැන යාච්ඤා කරන්න.

**ජූලි:11-** පාලක සැම් සෙල්වරාජ් ඇතුළු ඔහුගේ පවුලේ සාමාජිකයන් නපුරු උවදුරු වලින් ආරක්ෂා කරන මෙන් යාච්ඤා කරන්න.

**ජූලි:12-** කිතුණු මිෂනාරිවරුන් ගැන යාච්ඤා කරන්න.

**ජූලි:13-** කිතුණු ඇදහිලිවතුන්ට ගෞරවනීය දේව භයක් ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**ජූලි:14-** කිතුණුවන් යේසුස්වහන්සේට වඩාත් ආදරය කරන පිණිස යාච්ඤා කරන්න.

**ජූලි:15-** රැකියා, විරහිත, සුදුසු රැකියාවක් අපේක්ෂාවෙන් සිටින අය උදෙසා යාච්ඤා කරන්න.

**ජූලි:16-** සුදුසු විවාහයක් අපේක්ෂාවෙන් සිටින අය උදෙසා යාච්ඤා කරන්න.

**ජූලි:17-** අපට විරුද්ධ වැරදි කළ අයට සමාව දී නිදහස් කර යාච්ඤා කරන්න.

**ජූලි:18-** සෑම කිතුණුවෙක්ම යේසුස්වහන්සේගේ ඉගැන්වීම් වලින් සන්නද්ධ වන පිණිස යාච්ඤා කරන්න.

4 පිටුවෙන්....

ඔබගේ අවධානය කොතැනද? ඔබ පිළිතුරක් බලාපොරොත්තු වන්නේ කාගෙන් ද? ඔබගේ ප්‍රශ්නවලට විසඳුම් සොයන්නේ කොහෙන් ද?

## 3. සිතේ ශෝකය ආත්මය බිඳෙයි.

***"තුෂ්ටිමත් සිත මුහුණ පැහැපත් කරයි එහෙත් සිතේ ශෝකයෙන් ආත්මය බිඳෙයි." (හිතෝපදේශ 15:13) "තුෂ්ටිමත් සිත හොඳ ඖෂධයකි. නුමුත් බිඳුනු ආත්මය ඇට වියළවයි." (හිතෝපදේශ 17:22)***

යකඩ පිත්තල හා ඇලුමිනියම් යන ද්‍රව්‍ය වලින් සෑදූ ඕනෑම දෙයක් කැඩුණු විටදී ඒවා ඇලවීමට යොදා ගන්නා ගම් වලින් එය අලවා ගැනීමට පුළුවන. අපගේ හදවත තුළ සැඟවී ඇති ආත්මය කැඩුණු හොත් කිසිම වෛද්‍යවරයෙකුට එය හැඩ ගැසීමට නොහැකිය. අප ලෝකය තුළ මුහුණ දෙන්නාවූ ආර්ථික අර්බුදය, රෝගී තත්ත්වයන්, පවුල් අඬදබර ආදී දේ නිසා අපගේ ආත්මය බිඳෙනු ඇත. මෙයින් සුවය ලබා ජයග්‍රාහණය ලබා ගැනීමට හැක්කේ ස්වාමි වූ දෙවියන්වහන්සේ වෙතට ගොස් උන්වහන්සේගේ මුහුණ සෙවීමෙන් පමණි. ***"ස්වාමින්වහන්ගේ ගෘහයට යමුයැයි ඔවුන් මට කී විට මම සන්තෝෂ වීමි." (ගීතාවලිය 122:1)*** සැබැවින්ම දෙවියන්වහන්සේට නමස්කාර කර යාච්ඤා කරන්නාවූ සෙනඟ හා සමග එකතු වී ගමන් කිරීම ඉතා අනර්ඝයි. ශුද්ධාත්මයෙන් පූර්ණව අත්පොළොසන් දී දෑත් ඔසවමින් දණ ගසා ස්වාමින්වහන්සේට ආත්මයෙන් හා සැබෑ කමෙන් නමස්කාර කරන්නාවූ තැනැත්තෙක් හා සභාවක් වන්න. එවිට ඔබ ප්‍රීතියෙන් හා සතුටින් පිරෙනු ඇත. ඔබගේ රෝගය ඔබ වෙතින් පහ වෙනු ඇත. යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් වලින් ඔබ නිදහස් වනු ඇත. ඔබගේ සියලු බැමි වලින් ඔබ සදහටම නිදහස් වනු ඇත.

අපගේ කැඳවීම ප්‍රතිරාව සභාවේ අප මෙවැනි නමස්කාරයක් කරමු. සෙනඟ කොපමණ ප්‍රීතියකින් පිටත්ව යනවා ද? අප මහත් සමාදානයක් භුක්ති විඳිමු. ප්‍රිය දේව ගැති වරුනි, ඔබගේ සභාවේ සාමාජිකයින් සියලු දෙනාවම වැඩි කාලයක් නමස්කාර සඳහා යොමු කරන්න. මෙය කියවන්නාවූ සැම දෙනාටම මා පවසන්නේ ඔබගේ සභාවේ නමස්කාරයට සහභාගි වන්න. එවිට ඔබගේ සියලු බැමි කැඩී බිඳී ගොස් ඔබ ආශිර්වාද ලබා ගන්නවා ඇත. ***"ස්වාමින්වහන්සේ තුළ නිතරම ප්‍රීති වෙයල්ලා, ප්‍රීති වෙයල්ලා යැයි නැවතත් කියමි." (පිලිප්පි 4:4)*** දෙවියන්වහන්සේගේ බලාපොරොත්තුව හා ප්‍රීතිය ගෙන දෙන්නාවූ එකම ස්ථානය වන්නේ සභාව පමණි. ඔබ ඔබගේ සභාවට ගොස් උන්වහන්සේ අභිමුඛත්වය තුල සැමදාම නමස්කාර කරන්න. ***"ස්වාමින්සේ ගෘහයෙහි හිඳවන ලද්දෝ අපේ දෙවියන්වහන්සේගේ මිදුල්වල සඵල වන්නෝය." (ගීතාවලිය 92:13)***

## 4. සිත බිඳී යයි.

***"මනුෂ්‍යයෙකුගේ සිතේ නලංගුව නිසා එය නැමී යයි. එහෙත් කරුණාව සහිත වචනක් එය සන්තෝෂ කරයි." (හිතෝපදේශ 12:25)***

පීඩාවත් ආතතියත් වැඩි වන විටදී අපගේ හදවතේ සාමාන්‍ය ක්‍රියා කාරිත්වය අඩපන වනු ඇත. සිත බිඳී ඇති අවස්ථාවකදී කෙනෙක්ට නිදහසේ සිටීමට නොහැකිය. අපගේ මනසට ඇති වී තිබෙන ප්‍රශ්නකාරී තත්ත්වය නිසා අප බොහෝ වැරදි තීරණ ගැනීමට පෙළඹෙනු ඇත. සමහරු ඔවුන්ගේ නිවසින් පිටව ගොස් සමාදානය සොයන්නේ කොහෙන් ද? කියා එය සොයති. තවත් සමහරු වෙනත් මාර්ග සොයා ඇති. එය කිසිවකින්වත් ඔවුන් සොයන සමාදානය ඔවුන්ට නොලැබුන විටදී ඔවුන් ඉතා භයානක තීරණ වලට යොමු වෙති. නමුත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ ජීවත්වන්නා වූ කෙනෙක්, එම මාර්ග තුල ගමන් කරන කෙනෙක් මෙවැනි තත්ත්වයන් තුලින් යන විටදී කිසිවිටකත් වැරදි තීරණ ගැනීමටවත් තම ජීවිතය නසා ගැනීමටවත් පෙළඹෙන්නෝ නැත. ඔවුන් ක්‍රිස්තුස්වහන්සෙගේ මාර්ගය තුළ ගමන් කරන නිසා ඔවුන්ගේ බලාපොරොත්තුව ස්වාමින්වහන්සේ තුළ තබා සිටී.

දාවිත් රජ බොහෝ ප්‍රශ්නකාරී තත්ත්වයන් වලට මුහුණ දෙනු ලැබූවත් ඔහු දෙවියන්වහන්සේ තුල විශාල ඇදහිල්ලක් ඇති ව ජීවත් විය. ***"දාවිත් තද අමාරුවට පත්විය. නමුත් දාවිත් තමාගේ දෙවි වූ ස්වාමින්වහන්සේ තුළ ශක්තිය උපදවා ගත්තේය." (1 සාමුවෙල් 30:6)***

## 5. දාවිත්ගේ දිනපතා අත්දැකිම්

***"දෙවියන්වහන්සේ මට කරුණාකල මැනව, මක්නිසාද මනුෂ්‍යයා මා ගිලගන්නට කැමැත්තේය. ඔවුහු දවස මුළුල්ලේම යුද්ධ කරමින් මට පීඩා කරයි." (ගීතාවලිය 56:1)***

පීඩාවන් කරදරයන් තුන් ආකාරයකින් අපිට පැමිණෙනු ඇත.

**1. අපගේ සිතිවිලි නිසා**

**2. අපගේ ජීවිතයේ අපි ගනු ලබන වැරදි තීරණ නිසා**

**3. නපුරු ආත්මයේ බලපෑම නිසාත් මනුෂයයන්ගෙන් අපට ඊර්ෂියාව හා කෝපය නිසා**

### ✤ මනුෂ්‍ය භය :- ✤

සමහර අවස්තාවන් වලදී අප ගැන අපට තිබෙන්නාවූ විශ්වාසය අපට නැති වී යනු ඇත. එයට හේතුව නම් අපගේ මනසට භයානක හා අධෛර්‍යකමේ සිතිවිලි නිසාය. මනුෂ්‍යයන් මාව ගිල ගැනීමට බලා සිටිනවාය කියා දාවිත් පවසයි. භය හා සැකය ඇති වූ විට එය ඕනෑම මනුෂ්‍යයෙක්ව බල රහිත කිරීමට හැකිය.

දාවිත් වටා බොහෝ සතුරන් සිටිනිසා ඔහුට නිතරම මනුෂ්‍ය බයක් තිබුණි. මන්ද ඔහු නිතරම යුද්ධ කල නිසා ඔවුන් තුළින් ඔහුට හානියක් සිදුවේය කියන බය ඔහු තුළ තිබුණි. තව ද ඔහුට ඉතා තදින්ම මේ බය දැණුනි.

***"මාගේ සියළුම ඇට වෙව්ළවාවූ භීතයක් ද චංචලයක් ද මට පෙණුනේය. එවිට ආත්මයක් මාගේ මුහුණ ඉදිරියෙන් ගියේය. මාගේ ඇගේ මවිල් ද කෙලින් සිටියේය." (යෝබ් 4:14-15)***

භය වෙන්නාවූ සැම දෙනාම දෙවැනි මරණය නැමැති ගින්නෙන් හා ගෙන්දගමින් යුතු විලට හෙලනු ලබන බව දේව වචනයේ පවසා ඇත. ***"නුමුත් භය ඇත්තන්ටත්, අවිශ්වාස කරන්නන්ටත්, පිළිකුල්ව සිටින්නන්ටත්, මිනී මරණ්නන්ටත්, වේශ්‍යකම් කරන්නන්ටත්, මායා කාරයන්ටත්, රූප වඳින්නන්ටත් සියළු බොරු කාරයන්ටත් ගින්නෙනුත් ගෙන්දගමිනුත් දූවෙන විලෙහි තමුන්ගේ කොටස වන්නේය. එය දෙවැනි මරණයයි." (එළිදරව්ව 21:8)*** මෙම භයෙන් අපට ජයග්‍රහණය ලබා ගැනීමට ඇත්තේ දෙමුහත් කඩුවක් වැනි දේව වචනය කරනකොටගෙන පමණි.

පළමුව අප මෙවැනි භය පැහැදිලිව හඳුනා ගැනීමට අවශ්‍යයි. එය යක්ෂයාගේ ආත්මයකි. ***"මක්නිසාද දෙවියන්වහන්සේ අපට දුන්නේ බයාදුකමේ ආත්මයක් නොව බලයේත් ප්‍රේමයේත්, හික්මවීමේත් ආත්මයක්ය." (2 තිමෝති 1:7)*** මෙම භය පටන්ගන්නේ නරකාදියෙනි. නමුත් විශ්වාස කරන්නාවූ අයට මෙම භය බලපාන්නේ නැත. භය කියන්නාවූ දෙය පුරුද්දක්ය කියා බොහෝ දෙනා සිතති. තවත් සමහරු භය

ඉතා සුළුවට ගණන් ගනිති. තවත් අය එය ආත්මික කාරණා හා සමග සම්බන්ධ නැති බව පවසයි. නමුත් මේ භය ඔබ තුළ වර්ධනය වී දිනකදී එය බෝම්බයක් ලෙස පිපිරී ඔබව විනාශ කරනු ඇත. මන්ද එය නපුරාගෙන් පැමිණෙන්නාවූ දෙයකි. එම නිසා ඔබ මෙම භයට විරුද්ධව නැගී සිටිය යුතුයි.

ඔබගේ ජීවිතයට මෙම නපුරු ආත්මය විසින් ගෙනෙන්නාවූ මෙම භයෙන් ඔබ මිදෙන පිණිස ඔබ දෙවියන්වහන්සේට මුළුමනින්ම කැප වෙන්න. දෙවියන්වහන්සේගේ වචනය තුළ බයාදු කමේ ආත්මය ගැන ඔබට කියනවා ද කියා දැන ගෙන දැන්ම එයට විරුද්ධව නැගී සිට එම භය ඔබ තුළින් දැන්ම ඉවතට දමන්න. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ලේ කරනකොට ගෙන උන්වහන්සේ ඔබට දුන් ජයග්‍රහණය තුලින් ඔබව භයෙන් මුදවා තිබේ. නිතරම යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ලේ තුලින් ඔබවා සඟවා තබාගන්න. ***''මක්නිසාද මා භය වෙන දේ මට පැමිණෙන්නේය. මා භයපත් කරන දේ මට සිද්ධ වන්නේය.'' (යෝබ් 3:25)***

අපගේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කල්වාරියේදී සිදු කල යාගය කරණකොටගෙන උන්වහන්සේගේ ලේ වැගිරීම කරණකොට ගෙන උන්වහන්සේ යක්ෂයාව පරාජයට පත් කලේය. එබැවින් එම යාගය අප විශ්වාස කරමින් යක්ෂයා පරාජිත බව දැනගෙන අප එය විශ්වාස කරමින් යේසුස්වහන්සේගේ ලේ තුළ ඇති බලය දැනගෙන අපි මෙයින් ජය ගත යුතුය. තවද යක්ෂයා අපව වැට්ටීමට යොදා ගන්නාවු උපක්‍රම ගැනද අප දැනගත යුතුය. ***''ක්‍රිස්තුස්වහන්සේ ඉදිරියෙහි නුඹලා උදෙසාය. මක්නිසා ඔහුගේ උපායවල් අප විසින් නොදැන සිටිනවා නොවේ. (2 කොරින්ති 2:11)***

## දොරටු පාලකයා

දොරටුපාලකයාගේ රාජකාරිය නම්, ඔහුගේ ස්වාමියා පැමිණීමට පෙර ඔහුගේ පෙරමගට ගොස් ඔහුට ඇතුල්වීම පිණිස දොරටුව විවර කිරීමයි. යක්ෂයාගේ දොරටුපාලකයා නම් භයයි. යක්ෂයාට පෙර භය පැමිණ මනුෂ්‍යයන්ගේ හදවතේ දොර යක්ෂයාට විවෘත කරයි. මෙම නපුරු ආත්මය යක්ෂයා විසින් සියලු ආකාර සැලසුම් යොදමින් මනුෂ්‍යයන්ව විනාශ කිරීමට යක්ෂයා මේ භයාදුකමේ ආත්මය මනුෂ්‍ය හදවත් වලට වපුරනවා ඇත. යෝබ් පැවසූ දෙයින් අපට මෙසේ පෙනයි. '... ***මා භයවූ දෙයම මට පැමිණෙයි'*** කියා ඔහු පැවසීය. ඇදහිල්ල අපට නොපෙනෙන්නාවූ දෙවියන්වහන්සේගේ ආශිර්වාදය ගෙන එන්නාක් මෙන් යක්ෂයා බය පාවිච්චි කරමින් ඔහුලේ සියලුම ක්‍රියාවන් මනුෂ්‍යය ජීවිතය තුළ ක්‍රියා කිරීමට මෙම භය නැමති දොරටු පාලකයාව පාවිච්චි කරනු ඇත. එමනිසා අපගේ හදවතේ දොර විවර කිරීමට ඉඩ නොදී එම සිතිවිලි වලට විරුද්ධව නැගී සිටිය යුතුය. ඔබගේ පිරිසිදු පවිත්‍ර ජීවිතය කරණකොටගෙන යෙස්සුවහන්සේගේ නාමයෙන් මෙම භය ඔබ තුළට ඇතුල් වීමට ඉඩ නොදෙන්න.

## වරදින වචනඃ-

***''දවස මුළුල්ලේම ඔව්හු මාගේ වචන වරදවා පෙන්වති. ඔවුන්ගේ කල්පනා සියල්ලම මට උපද්‍රව පිණිසය.'' (ගීතාවලිය 56:5)***

අප සැම දෙනාටම විවිධාකාරවූ මාර්ග තුලින් ප්‍රශ්න පැමිණෙනු ඇත. අප නොකරපු දෙයකට අපව වරදට පත් කරනු ලබයි. දාවිත්ට ඔහුගේ වචන වරදවා තේරුම් ගනු ලැබුවේය. මෙය එක දවසක් නොව සැමවිටම ඔහුට සිදුවිය.

මෙවැනිම වු අත්දැකීම් අපගේ ජීවත වල ද සැමදාම සිදුවෙයි. අප අමතක නොකල යුතු දෙයක් නම් අපගේ සියලුම නපුරු කාරණා උන්වහන්සේ යහපතට පෙරලන සේක. ගීතාවලිය 34:19 හි මෙසේ පවසයි. ''ධර්මිෂ්ඨයාගේ පීඩා බොහෝය. නුමුත් ස්වාමින්වහන්සේ ඒ සියල්ලෙන් ඔහු ගළවන සේක.'' යනුයි. අප අමාරුකමේ මාර්ගයෙහි ඇවිදින විට එය අපගේ අවසානයට කියා සිතන්නට එපා. අවංක පුද්ගලයන්ට පීඩා බොහෝ බවත් ඒ සියලු පීඩා වලින් ස්වාමින්වහන්සේ ඔහුව මුදවන බවත් අප දැනගත යුතුය. ඔබ ධර්මිෂ්ඨ වු පුද්ගලයෙක් ද? යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ලේ කරණකොටගෙන ඔබ පව්කමාව ලබා තිබේ ද? කිසිම පාපයකින් තොර වු ජීවිතයක් ඔබ ගත කරනවා ද? ඔබ අවංක ජීවිතයක් ගත කරනවා ද? මේ සියල්ල ඔබගේ ජීවිතයට අත්‍යාවශ්‍ය වෙයි.

***''ඔබ අපට පීඩා කල දවස් ගණන ලෙස ද අප විසින් නපුර දුටු අවුරුදු ගණන ලෙස ද අප සන්තෝෂ කල මැනව'' (ගීතාවලිය 90:15)*** මෙලෙස යාච්ඤාවක් තිබේ. අපට නැති වු සියලුම දේ අපට නැවත දෙමින් අපගේ ජීවිතයට ප්‍රීතිය හා සමාදානය දීමට දෙවියන්වහන්සේ ඉතා බලසම්පන්නව සිටී. ඔබ ධර්මිෂ්ඨකම නිසා දුක් විදිනවා නම්, ඔබගේ ආයුෂ දීර්ඝය. භය නොවන්න. මගේපීඩා දවසේදී මගේ විපතේදී සැබවින්ම යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල මගේ ඇදහිල්ල තබමි.

මට භය ඇතිවන වේලාවේදී මාගේ ජීවිතයේ භයානක අවස්ථාවේදී මම සැබැවින්ම යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ මගේ බලාපොරොත්තුව තබමි. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිතරම මා රැකබලා ගනී.

මෙවැනි ඇදහිල්ලේ බලාපොරොත්තුවේ වචන නිතරම කියන්න. සැබවින්ම ප්‍රීතිය හා සමාදානය ඔබගේ හදවත පුරවන්නේය.''

අප ප්‍රශ්න හා කරදරකාරී තත්ත්වයක් තුලින් ගමන් කරන විටදී අප කථාකරන්නාවු වචන යහපත් නොවනු ඇත. අප හොඳ කිතුණුවන් වුවත් පීඩා අවස්ථාවන් වලදී අප කථාකරනු ලබන්නේ මෙවැනි වචනය.

*10 වෙනි පිටුවට ...*

**Echo of His Call Postal Courses for candidates in India only**

**Pray for** BIBLECOR



We offer Postal Course on Basic Truths of The Bible to new Christians and non-Christians in English – 57 pages, Hindi – 76 pages & Tamil – 96 pages. You will get a course book entitled **New Life – For You!** **After the completion of this course, you will get a certificate.**

**There will be no compulsory fees. You will be blessed!**

The Chairman, Nehemiah Bible College, Echo of His Call, Post Box 2957, CHEPAUK, CHENNAI - 600 005.

Ph.: (044) 2852 8282, 2852 9293, 2854 7766, Cell : 98410 71852, 95661 31858 E.mail : biblecor@yahoo.co.in



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

**"...කියවන්නා තේරුම් ගනීවා...."** *(මතෙව් 24:15)*

**මගේ තරුණ කාලයේ හදගැස්මත්, මගේ ලේ ගමන්කිරීමත් මගේ මැවුම්කාරවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේම පමණයි.**



Sis. Emiyammal Sanyasini Ammal




Bro. John Wycliffe

1967 වන වසරේදී සහෝදරී මෙමයිඅම්මාල් සන්යාසිනි අම්මාල් නෛයූර් නගරයේ දින තුනක ශුභාරංචි රැස්වීම් මාලාවක් පැවැත් විය. මාගේ මුල් කාලයේ අධ්‍යාපන කටයුතු කරනු ලැබුයේ මෙම නගරයෙහිය. මෙම දේව දාසිය ඉතා මහළු කාන්තාවකි. නාසරෙත් යාච්ඤා සහභාගීත්වයට පැමිණ සමහර සහෝදරයන් එනම්, සහෝදර මයිකල් චෙල්ලදුරෙයි, සහෝදර ජෝන් වෙක්ලිෆ් සහෝදර යොෂුවා ඥානදුරෙයි සහ සහෝදර ජෝන් කෝවිල්පිච්චෛයි යන අය පැමිණ ඇය සමඟ දේව වචනය දේශනා කළේය. මේ අයට උදව් කරන පිණිස සහෝදරී ඉමෛයිඅම්මාල් මාවද පත් කරනු ලැබීය. මා ඔවුන් අවශ්‍ය සියලුම වැඩ මා විසින් ඉටු කළෙමි. ඔවුන් අයියදුරෙයිට අයිති ගොඩනැගිල්ලක උඩුමහළෙහි නවාතැන්ගෙන සිටින ලදි. මෙම වෛද්‍ය අයියදුරෙයි මෙම සහෝදරයන්ගේ සේවයට මුදල් වලින් උපකාර කරන ලදි. ඔහුගේ බාල සහෝදරයා වූ වෛද්‍ය සයිමන් ළමා රෝහලක් පවත්වාගෙන යනු ලැබුවේය. ඒ කාලය වන විටදී මාගේ වයස අවුරුදු 18 කි. ඔහු මා දෙස බලා, "ඔබ තුළ විශේෂ දෙයක් තිබෙනවා. මේ රැස්වීම් මාලාවේදී තරුණ දේශකයෙක් ගැළවීම ලැබුවේ කොහොමද? ඔවුන් ලෝකයේ කාරණාවලින්



Dr. D. Ayyadurai



Dr. D. Simon



Bro. Joshua Gnanadurai, Bro. Michael Chelladurai, Mr. John Arputharaj

මිදී තරුණ කාලයේදී ප්‍රීතියෙන් හා සතුටින් යුත් පවිත්‍ර ජීවිතයක් ගත කරන්නේ කෙසේද?" කියා පවසනු ලැබීය.

එම රැස්වීම් මාලාවේ අවසාන දිනයේදී මාගේ පවුකාර වූ ජීවිතය මට පෙනුනි. මා යේසුස්වහන්සේව මාගේ පුද්ගලික ගැළවුම්කරු ලෙස පිළිගත්තෙමි. මා පිරිසිදු ජීවිතයක් ගත කිරීමට පටන් ගත්තෙමි. දෙවියන්වහන්සේ ප්‍රියවන අන් අයට ප්‍රයෝජනවත් වන ජීවිතයක් ගත කරනවාය කියා මා තීරණය කළෙමි. මේ හැඟීම යේසුස්වහන්සේට මුළු හදවතින්ම සේවය කිරීම පිණිස මාව පෙළඹෙව්වේය. එදින මාගේ ජීවිතය මා මුළුමනින්ම උන්වහන්සේට කැප කළෙමි. මා එදින ගැළවීමේ ප්‍රීතිය අත්දුටුවෙමි. උන්වහන්සේ මාගේ සිත පිළියෙල කර මාව අලුත් මනුෂ්‍යයෙක් බවට පත් කළේය. ***"... සිත අලුත්කර ගැනීමෙන් අන්‍යාකාර ඇත්තෝ වෙයල්ලා.." (රෝම 12:2)***

මේ දේව මෙහෙය අවසන් වූ විට මෙම දේව දාසයින් ඔවුන් සමඟ යාමට මටද එන්නය කියා ආරාධනා කළේය. මා මාගේ දෙමාපියන්ගේ අවසරය ඇතිව ඔවුන් සමඟ ගියෙමි. ඔවුන් තිරුනෙල්වේලි වල තිබූ නාසරෙත් නුවරට මාව රැගෙන ගියේය. ශුභාරංචිය ප්‍රකාශ කළාවූ ඉමෛයිඅම්මාල්ද අපත් සමඟ සිටියේය.

### නාසරෙත් යාච්ඤා සහභාගීත්වයෙ ඉතා උතුම් අත්දැකීම්


එම ස්ථානයෙහි පැවැත් වූ යාච්ඤා රැස්වීමට පාසැල්වල ගුරුවරු, විශ්ව විද්‍යාල කථිකාචාර්යවරු වැනි බොහෝ උගත් පිරිස් සෑම දවසකම සහභාගී විය. උදෑසන ආහාරයට බත් සහ සාම්බාරු දුන්නෝය. දිවා ආහාරය සඳහාද එම ආහාරයම ලබා දුන්නෝය. රාත්‍රියටද

එවැනිම වූ රසවත් ආහාරයක් ලබා දුන්නේය. එය මා හට මහත් අත්දැකීමක් විය. මා මෙම කූඩාරම තුළ සිටින විට රෑ දාවල් දෙවියන්වහන්සේගේ ක්‍රියාවන් අත්දුටුවේය. එම ස්ථානයෙහි සිටි මෙම දේව දාසයින්ගේ ජීවිත දැක සේවය කිරීමට මා තුළ විශාල ආශාවක් ඇති විය. මාගේ හදවතේ ආශාව වූයේ මෙවැනි කෙනෙක් වෙන්න ඕනිය කියාය.

## තනි වූ ස්ථානයේදී ලැබූ අත්දැකීම්

සෑම දිනකදීම උදෑසන 5.00 සිට 8.00 දක්වා හැම කෙනෙක්ම එම ස්ථානයෙහි පුද්ගලිකව වෙන්ව ගොස් යාච්ඤාවෙහි නිරත වූවාය. ඔවුන් එහිදී බයිබලය කියවා එය මෙනෙහි කිරීමට කාලයක්ද වැය කරනු ලැබීය. තවද ඔවුන් කණ්ඩායම සමඟ එකතු වී සාක්ෂි දරනු ලැබීය. මටද සෑම දිනකදීම ඔවුන් සමඟ එකතු වී සහභාගීකම් පැවැත්වීමට අවස්ථාව ලැබුණි. එහිදී මා යාච්ඤා ජීවිතයෙහි රහස දැනගතිමි. එමෙන්ම ශුද්ධාත්මයාණන්වහන්සේගේ මඟපෙන්වීම ඇතුව ජීවත්වන ආකාරය ගැනද ඉගෙනගත්තෙමි.

එහි සිටි සමහර අයගේ නම් අදටත් මගේ මතකයේ පවතී. එනම්, සහෝදර ශාන්ත කුමාර්, සහෝදර ජේකොබ් සෙල්වරාජ්, සහෝදර ජෝන් අප්පාදුරෙයි,



Bro. John Koilpitchai



Bro. R. Stanley (Blessing Youth Mission)

සහෝදර පාක්සරාජ්, සහෝදර පිලිප් ජයසිංහ, සහෝදර ගුණසේකර, සහෝදර කුමාරදාස් (තෙන්කාසි) සහෝදර කුමාර් දාස් (බැංගලෝර්) සහෝදර එම්මැනවෙල්, සහෝදර කුමාර්, සහෝදර ස්ටැන්ලි, සහෝදර ඩැනියෙල්, සහෝදර ගිඩියොන්, සහෝදර සැමුවෙල්, සහෝදර තිමති, සහෝදර මාණික්කසම්, සහෝදර කාලෙබ්, පෝල් පාන්ඩියන්, සහෝදර ජෝශප් ගුණසිංහ, සහෝදර ටයිටස් සුන්දරම්, සහෝදර බෙනී, සහෝදර ජෝති පාණ්ඩියන් යන අයයි.

දින 15කට පසු සහෝදරී ඉමෙයිඅම්මාල් සන්නාසිනී අම්මාල් මාව නැවත ගෙන යන පිණිස මා සිටි ස්ථානයට පැමිනුණේය. මේ දේවදාසිය කඳුළු සමඟ මා හා එකතුව යාච්ඤා කළාය.

එම අවස්ථාවේදී සහෝදර මයිකල් සෙල්වදුරෙයි, සහෝදර ජෝන් වෙක්ලීගේ සහෝදර ජොෂුවා



*Nazareth Prayer Fellowship - 1967*

ඥානදුරෙයි, සහෝදර ජෝන් කොයිල්පිච්චෙයි සහ තවත් දෙවියන්වහන්සේ තුළ ප්‍රධාන සහෝදරයන් සමඟ එකතු වී ඔවුන්ගේ දෑත් මා පිට තබමින් මා උදෙසා යාච්ඤා කළේය. එම යාච්ඤාවේදී යම් කෙනෙක් මා හට අනාගත වචනයක් මෙසේ ප්‍රකාශ කළේය.

''සෑම් සෙල්ව රාජ් පුතා මා ඔබව මාගේ සේවය සඳහා තෝරාගෙන තිබෙනවා. ඔබ කරණකොටගෙන විශාල දේවල් මා කිරීමට යනවා ඔබගේ නමේ ප්‍රකාරයට ඔබව මහත් වූ ප්‍රොපේතවරයෙක් කරමින්ද යාච්ඤාවේ මනුෂ්‍යයෙක් කරමින් හා බයිබලයේ සඳහන්ව ඇති සාමුවෙල්ව මෙන් මා ඔබව පාවිච්චි කරමි. බොහෝ ජනතාවගේ ආත්මික පියෙක් බවට මා ඔබව පත් කිරීමට යනවා. ඔබ කිසිම ලැජ්ජාවකට පත්නොවී මාගේ නාමය නිසා ඔබව උසස් වූ ස්ථානයක තැබීමට යනවා. ඔබ ආශා වෙන්නාවූ සියලුම දේ මා ඔබට දීමට යනවා. මාගේ නාමය නිසා ඔබව මේ ලෝකයේ බොහෝ රටවල වලට ගෙන ගොස් පාවිච්චි කරනු ලබනවා. ඔබට නීරෝගීකම ලබා දී දීර්ඝායුෂයෙන් මා ඔබව පාවිච්චි කරනවා. ***''නුඹ මා ඉදිරියේ අනර්ඝව ගරුකටයුතු වූ බැවින්ද, මා නුඹට ප්‍රේමකළ බැවින්ද, නුඹ වෙනුවට මිනිසුන්ද නුඹේ ජීවිතය වෙනුවට ජනයන්ද දෙන්නෙමි'' (යෙසායා 43:4)***



මේ සිදුවීමෙන් අනතුරුව 1969 වන වසරේදී දෙවියන්වහන්සේගේ බලවත් දේව දාසියෙක් වූ පෙරමග දූතයා පත්‍රයෙහි කර්තෘ වන එස්. දේවදාසන් වෙතට මාව ගෙන ගියාය. දෙවියන්වහන්සේ යහපත්ය.

RNI NO. TN/SIH/2006/17846

*7 පිටුවෙන්....*

1. ස්වාමින්වහන්සේ මගේ යාච්ඤාවට ඇහුම්කන් දී නැත. (යෝබ් 30:20)
2. ස්වාමින්වහන්සේ මා දෙස නිකන් බලා සිටින සේක. (යෝබ් 30:20)
3. ඔබ මට කෲර වී සිටියි. (යෝබ් 30:21)
4. ඔබ මට හතුරෙකුට මෙන් පීඩා කරයි. (යෝබ් 30:21)
5. ඔබ මාව කුණාටුවෙන් දියවෙන්නට සලස්වන සේක. (යෝබ් 30:22)
6. මම සැපත බලා සිටින විට විපත පැමිණුනේය. (යෝබ් 30:26)
7. මම එළිය බලා සිටිය මුත් පැමිණුනේ අන්ධකාර යයි. (යෝබ් 30:20)
8. කිසි කෙනෙක් අත් නොවිඳි ප්‍රශ්න වලට මා මුහුණ දෙමි.
9. මගේ ජීවිතයේ කණගාටුවෙන් හා සුසුම්ලීමෙන් ගෙවී තිබේ. (ගීතාවලිය 31:10)
10. මගේ ශක්තිය පිරිහෙයි.

ඔබ සිටින්නේ මෙවැනි තත්ත්වයෙන් ද? අධෛර්යට පත් නොවන්න. ස්වාමින්වහන්සේ ඔබට මහත් වූ දේ කරයි. නමුත් ඔබ කල යුතු දෙයක් තිබේ.

1. අශුභවාදී ඇදහිල්ල නොමැති වචන කථා නොකරන්න. නිතරම ඇදහිල්ලේ හා බලාපොරොත්තුවේ වචන පවසන්න.

2. ඔබගේ ආත්මයන් ඇදහිල්ලත් විනාශකිරීමට තැත්කරන්නා වූ අය සමග සම්බන්ධකම් නොපවත්වන්න. ඔබගේ ඇදහිල්ල වර්ධනය කරන්නාවූ විශ්වාසවන්ත අය සමග නිතරම සහභාගිකම් පවත්වන්න. අන් අය ඉදිරියේ ආදර්ශමත් ජීවිතයක් ගත කරන්න.

3. කිසිම යහපතක් සිදු නොවන බව සිතෙන විටදී යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ව විශ්වාස කරන්න. ස්වාමින්වහන්සේගේ බලයෙන් හාස්කම් සිදුනොවන බව විශ්වාස කරන්න. බලාපොරොත්තුවේ සැබැවින්ම හාස්කම් සිදුවන සේක.

"ඔබ මාගේ වැලපීම නැටීමට පෙරළූසේක...." (ගීතාවලිය 30:11) *

## කැඳවීමේ ප්‍රතිරාවය

සැම මසකම භාෂා 16 කින් නිකුත් වන සඟරාව, බයිබල් විද්‍යාලය, තැපැල් මාර්ගික බයිබල් පාඩම් මාලාව, සභා රෝපණය, පාසැල් අධ්‍යාපනික සේවය, සුභාරංචි රැස්වීම් මාලා, සම්මේලනය පැවැත්වීම ආදිය.

| | |
|---|---|
| වාර්ෂික දායකත්වය - රු. 100/- | ජීවිත දායකත්වය - රු. 2000/- |

කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ විවිධාකාර සේවාවන් අප පවත්වාගෙන යනු ලබන්නේ ඔබගේ උපකාරයන් හා ස්වේච්ඡාවෙන් ඔබ දෙන සම්මාදන් හා දීමනා කරණකොටගෙනය. ස්වාමීන්වහන්සේ ඔබට මඟපෙන්වන්නාවූ ආකාරයෙන් කැඳවීමේ ප්‍රතිරාවය සේවයට උපකාර කිරීමට ඔබටද හැකිය. ඔබ දෙන්නාවූ උපකාර කරණකොට ගෙන දෙවියන්වහන්සේව නොදන්නාවූ සෙනඟට සුභාරංචිය ප්‍රකාශ කිරීමට උපකාර වෙනවා ඇත.

ඔබට මෙම සඟරාව අවශ්‍ය නම්, කරුණාකර අපට දන්වා එවන්න. ඔබගේ ඊ-මේල් ලිපිනය හා දුරකථන අංකයද, එසේම ඔබගේ ලිපිනය වෙනස් කරනවා නම් එම වෙනස් වූ ලිපිනයද අපට දන්වා එවන්න.

අපගේ වෙබ් අඩවියට ගොස් මෙම භාෂා 16 කින් ඇති සඟරාවන් බලා ගැනීමට ඔබට හැකිවනු ඇත. ඔබගේ ලිපි, යාච්ඤා ඉල්ලීම් සහ ඔබගේ උපකාරයන් පහත ලිපිනයට අප වෙත එවන්න.

කරුණාකර ඔබගේ දුරකථන අංකය, ජංගම දුරකථන අංකය හා ලිපිනය අප වෙත එවන්න.

**ECHO OF HIS CALL**
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA
PH: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98412 71858, 98410 71852
E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in
Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.com

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS / 1 Patrika Channel"**
on 2nd **JUNE 2022.**
**If un-delivered please return to:**
**ECHO OF HIS CALL (SINHALA)**
**P.O. Box No. 2957,**
**Chepauk, Chennai - 600 005, INDIA.**
**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

***JESUS LOVES YOU!***

**To**

***GOD BLESS YOU!***

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No. 18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by him at **Echo of His Call Printers**, New No. 8 & 10, Old No. 18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**